පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ජූනි මාසය - 03 සතිය

ශ්‍රේණිය - 9

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

පාසල - ර/නිවි/කරවිට මධ්‍ය විද්‍යාලය

School Department of Education,Sabaragamuwa Province/ Weekly School

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | 6.0 | : | ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් වශයෙන් තෝරාගත් ශිල්පීන්ගේ කලානිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි. |
| නිපුණතා මට්ටම | 6.4 | : | තෝරාගත් ශෛලිගත වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන චිත්‍රමය ගුණාංග රසාස්වාදය කරයි. |
| ක්‍රියාකාරකම | 6.4.1 | : | "ශෛලිගත නාට්‍ය රස විඳිමු." |

පැවරුම - පහත සඳහන් කියවීම් පත්‍රිකාව කියවා සටහන් පොතට ඇතුළත් කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

**ශෛලිගත නාට්‍යය හැඳින්වීම**

නාට්‍ය ධර්මී සහ ලෝක ධර්මී යනුවෙන් ප්‍රධාන නාට්‍ය වර්ග දෙකක් වේ. මේ අතරින් ශෛලිගත නාට්‍යය අයත් වන්නේ නාට්‍ය ධර්මී අතරට ය. එම ශෛලිගත නාට්‍යයක විශේෂ ලක්ෂණ වන්නේ නාට්‍යයට අදාළ සියලු දෙබස්, ගීත සහ රිද්මානුකූල දෙබස් අනුසාරයෙන් යුක්ත වීම සහ නාට්‍යයේ සියලු ම අංග චලනයන් සහ ඇවිදයාම ආදිය සංගීත නාදයට සහ ගීතවලට අනුකූල ව රිද්මානුකූල ව සිදුවීම යි. මනමේ, සිංහබාහු සහ බෙරහඬ වැනි නාට්‍ය නිදසුන් ලෙස හැඳින්විය හැකි ය.

**පසුතල නිර්මාණය**

ශෛලිගත නාට්‍යවල දී වේදිකා පසුතලය චාම් සහ සරල බවකින් යුක්ත වේ. විශේෂයෙන් ම මෙහි දී ඒ ඒ අවස්ථාවට උචිත පසුබිම, ගීත ආදියෙන් ප්‍රේක්ෂකයාගේ මනසෙහි මවා දැක්වීමක් සිදු කරයි.

අංග රචනය

ශෛලිගත නාට්‍යක අංග රචනය (වේෂ නිරූපණය ) බහුල ව ම යොදා ගැනේ. ඒ ඒ චරිතයට අදාළ භූමිකාව සහ ගති ලක්ෂණ ඉස්මතු කර ගැනීම සඳහා අවශ්‍ය ආකාරයට මුහුණ පාට කිරීම සහ වෙනත් සලකුණු ඇඳීම මෙන් ම රැවුළ, කොණ්ඩා ආදිය ඇලවීම ආදිය මෙම නාට්‍යවල බහුල ව ම සිදු වේ. සිංහබාහු නාට්‍යයේ සිංහයාගේ චරිතය සහ මනමේ නාට්‍යයේ වැදි රජුගේ චරිතය නිදසුන් ලෙස දැක්විය හැකි ය.

රංග භාණ්ඩ

ශෛලිගත නාට්‍යවල එන විවිධ චරිතවලට අදාළ භූමිකාව ඉස්මතු කරලීම සඳහා රංග භාණ්ඩ අත්‍යවශ්‍ය වේ. එමෙන් ම එයින් නාට්‍යට යම්කිසි අලංකාරයක් ද ගෙන දේ. කඩු, හෙල්ල, තෝමර වැනි දේවල් මෙයට අයත් වේ.

රංග වස්ත්‍රාභරණ

නාට්‍යට අදාළ චරිතවල භූමිකාව සාර්ථක ව ප්‍රකාශ වීම සඳහාත් නාට්‍යයේ අලංකාරය උදෙසාත් රංග වස්ත්‍රාභරණවලින් මහත් පිටුවහලක් ලැබේ. ඇඳුම්, ඔටුනු, තලප්පට, කර මාල, උර මාල, වළලු, තෝඩු, මුදු, පාද ජාලා, පාද සලං සහ සපත්තු රංග වස්ත්‍රාභරණ ලෙස නම් කළ හැකි ය.





මනමේ වේදිකා නාට්‍යයේ අවස්ථාවක්

සිංහබාහු වේදිකා නාට්‍යයේ අවස්ථාවක්



බෙරහඬ
වේදිකා නාට්‍යයේ
අවස්ථාවක්

**1.** ශෛලිගත නාට්‍ය යනු මොනවාද?

**2.** ශෛලිතනාට්‍ය වල ලක්ෂණ මොනවාද?

**3.** අංග රචනය යනු කුමක්ද?

**4.** රංග භාණ්ඩ හා රංග වස්ත්‍රභරණ වලට උදාහරණ 5 බැගින් ලියන්න.

**5.** ඔබ දන්නා ශෛලිගත නාට්‍ය 4ක් නම් කරන්න.